18

# ශ්‍රී ලාංකේය පාලි අත්පිටපත්වල ස්වභාවය සහ බුදුදහම පිළිබඳ ශබ්ද විද්‍යාත්මක හැදෑරීම්

මහාචාර්ය මකුරුප්පේ ධම්මානන්ද හිමි

බුදුදහම තේරුම් ගැනීම සඳහා යොදාගනු ලබන උපායික ක්‍රමවේද රාශියක් වේ. ත්‍රිපිටකය කියවා එය ස්වකීය ඥානශක්ති ප්‍රමාණයෙන් වටහා ගැනීම ඉන් පළමු වැන්නයි. බුද්ධ දේශනාවල සරල ධර්ම කොට්ඨාස අවබෝධ කර ගැනීමට මෙය ප්‍රමාණවත් වන අවස්ථා ඇත. එසේ නො වන තැන්වල දී අට්ඨකථාවන් උපයෝගී කර ගැනීම දෙවන ක්‍රමය යි. එහි දී එළඹෙන නිගමනය වඩාත් තහවුරු කරගැනීම සඳහා ටීකා හා ප්‍රකරණ ග්‍රන්ථ ද උපයෝගී කර ගැනේ. තෙවැනි ක්‍රමය වන්නේ ශබ්ද විද්‍යාත්මක නයින් පද විශ්ලේෂණය කොට යම් යම් දේ වටහා ගැනීම යි. එය බුද්ධ දේශනාවෙහි එක් සුවිශේෂ ලක්ෂණයක් වන අක්ෂර, පද හා වාක්‍යගත ගැඹුරු අර්ථය විශ්ලේෂණය කිරීමකි. මෙම අක්ෂර, පද හා වාක්‍යගත අර්ථ ගම්භීරත්වය සුවිශද කොට ගත් ප්‍රමාණයට අවබෝධය පහසු වේ. මෙම ක්‍රමවේද ත්‍රිත්වය හඳුනාගත යුත්තේ අර්ථාවගමනයේ ප්‍රධාන අවයව තුනක් වශයෙන් වන අතර මෙම ලිපියේ දී සැලකිල්ලට භාජනය කෙරෙනුයේ මෙම ක්‍රමවේද ත්‍රිත්වය නිවැරදි අර්ථ ග්‍රහණය සඳහා නූතන ශ්‍රී ලාංකේය ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය තුළ යොදා ගැනෙන ආකරය පිළිබඳව යි.

බුදුන් වහන්සේ විසින් ප්‍රකාශිත අර්ථය (අත්ථ), එහි ඇතුළත් යථාර්ථමය සංසිද්ධිය (ධම්ම) මෙන් ම නිරුක්තිය (නිරුත්ති) හා ස්වකීය සුවිශද අවබෝධය (පටිභාන) යන හතර අපගේ පූර්ණ ඥාන ප්‍රභාවය බව ධර්මයේ ම පෙන්වා දී ඇත.[1] මේ නිසා ආගමික හා දාර්ශනික හැදෑරීම්වල දී නිඝණ්ඩු ශාස්ත්‍රය, කෙටුභ ශාස්ත්‍රය, ශබ්ද විද්‍යාව හා නිරුක්ති ශාස්ත්‍රය යනාදි ක්‍රමවේද යොදාගත් බව වෛදික යුගයේ සිට ම දැකිය හැකි ලක්ෂණයකි.[2] මෙහි දී පැන නගින ප්‍රශ්නයක් වනුයේ ධර්මය හැදෑරීමට ඉහත කී පරිදි ව්‍යාකරණය, නිරුක්ති ශාස්ත්‍ර යනාදිය අදාළ වේ නම් බුද්ධකාලයේ දී ශ්‍රාවකයන් තුළ ඒවා හැදෑරීමට ප්‍රබල දිරිගැන්වීමක් නො වූයේ කුමක් නිසා ද යන්න යි. මෙයට ලබාදිය හැකි පළමු වන පිළිතුර

වන්නේ මුල්කාලයේ ශාසනයට ඇතුළු වූ භික්ෂූන්ගෙන් වැඩි පිරිසක් බ්‍රාහ්මණ හා ක්ෂත්‍රිය වර්ණයන් නියෝජනය කිරීමත්[3] ඔවුන් තුළ පැවති සංස්කෘත භාෂා ඥානය පුළුල් වීමත් නිසා එම ආවශ්‍යකතාව නිරායාසයෙන් සපිරුණු බව යි. බුද්ධවචනය පිළිබඳ විග්‍රහාත්මක අවබෝධයක් ලැබීමට බ්‍රාහ්මණික ඉගැන්වීම යටතේ ලැබූ ව්‍යාකරණ, නිරුක්ති ආදි භාෂාත්මක පරිචිතය ඔවුන්ට ප්‍රමාණවත් විය. දෙවන කරුණ වන්නේ මුල්කාලයේ බුද්ධවචනය අධ්‍යයනයක් වශයෙන් නො ව භාවිතයක් වශයෙන් මූලික ව ක්‍රියාත්මක වීම යි. කාලයාගේ ඇවෑමෙන් බුදුදහම ධ්‍යාපන (භාවිත) මට්ටමෙන් අධ්‍යාපන (හැදෑරීම්) තත්ත්වයකට ප්‍රවේශ වීම යි.[4] තේරුම්ගත යුතු අනෙක් වැදගත්ම කරුණ වන්නේ කුල ගෝත්‍රික හා දේශවාසීන් විසින් විවිධ උච්චාරණ හා ලේඛන ක්‍රම මගින් ධර්මය පවත්වාගෙන ඒමේ දී විවිධ වෙනස්කම්වලට භාජනය වීමත් වෙනත් භාෂාවල ආභාසය මගින් පද සැකසීමත් ඒවා ත්‍රිපිටකයට ප්‍රවේශ වීමත් ය. එබැවින් ත්‍රිපිටකාගත යම් යම් පද හඳුනා ගැනීමට ශබ්ද විද්‍යාත්මක හැදෑරීම් කරනු දක්නට ලැබේ. බුද්ධවචනය සම්බන්ධ මෙම ශබ්ද විද්‍යාත්මක හැදෑරීම්වල වැදගත් ලක්ෂණ ඇති නමුත් ඇතැම් උගතුන් විසින් තම බුද්ධි ප්‍රභාවය තහවුරු කිරීම් වස් අත්තනෝමතික නිර්වචන සැපයීම නිසා සිදු වී ඇති නො වැදගත්කම් ද විද්‍යමාන වේ. කෙසේ නමුත් ශාස්ත්‍රීය අධ්‍යයන වශයෙන් පර්යේෂකයන්ගේ අවධානය සඳහා ශබ්ද විද්‍යාත්මක ව කරුණු විශ්ලේෂණය කිරීම ප්‍රයෝජනවත් වේ.

ථෙරවාදී සම්ප්‍රදාය නියෝජනය කරන්නන් වශයෙන් ශ්‍රී ලාංකික භික්ෂු සංඝයාට බුද්ධ දේශනාව ආරක්ෂා කිරීම විෂයෙහි විශේෂ වගකීමක් පැවරෙන බව අපි දනිමු. මෙය මැනවින් දැන සිටි මුල්කාලීන යතිවරුන් විසින් මාතලේ අලුවිහාරයේ දී බුද්ධවචනය ග්‍රන්ථාරූඪ කිරීමෙන් සිය වගකීම ඉටු කරන ලදී. එසේ ම ප්‍රතිබල සම්පන්න භික්ෂූන් වහන්සේලා බුද්ධි මණ්ඩලයක් වශයෙන් භාරතීය භික්ෂුවක් වන බුද්ධඝෝෂ හිමියන් හා සුසංයෝගී ව බුද්ධවචනයේ ගම්භීරස්ථානයන්ට අර්ථ විවරණ ග්‍රන්ථ සමුදායක් සැපයීම තවත් කරුණකි. ඊට අමතර ව ශ්‍රී ලාංකික භික්ෂූන් මෙම කාර්යය ඉටු කළ ආකාරය දිවයිනේ විවිධ ප්‍රදේශවලින් හමුවන විවිධ ත්‍රිපිටක සංස්කරණ හෝ පුස්කොළ අත්පිටපත්වලින් තහවුරු වේ. එම අත්පිටපත් සංස්කරණය ඇතැම්විටක පෞද්ගලික කාර්යයක් වන්නටත් තවත් විටෙක සාමූහික කාර්යයක් වන්නටත් ඉඩ ඇත. නිරපේක්ෂක උගත් යතිවරුන්ගේ තම කාර්යයේ නිරවද්‍යභාවය විනා ආත්මෝත්කර්ෂණය නො තැකූ හෙයින් ඉහත කී කරුණ අනාවරණය කොට ගත නො හැකි ය.

බුදුන් වහන්සේගෙන් උරුම වූ ඥානය ශ්‍රාවකයන් විසින් ධාරණයෙහි පවත්වා ගනිමින් පළමු සංගායනාවේ දී මූලික වශයෙනුත් අනෙක් සංගායනා දෙකෙහි දී ද්විතීයික වශයෙනුත් සංවිධානගත කළ බව අපි දනිමු. එම ඥාන සම්භාරය ඉන් පසුව භාණක නමින් හැඳින්වුණු විශේෂඥ භික්ෂු පිරිසක් විසින් ක්‍රි.ව. 5 සියවස

දක්වා සුරක්ෂිත ලෙස රැගෙන ආ බව ද සඳහන් ය.[5] මහාවිහාරික භික්ෂූන් බුද්ධඝෝෂ හිමියන්ගේ මූලිකත්වයෙන් සිදුකරන ලද්දේ එතෙක් පැවත ආ සාම්ප්‍රදායික ඥානය ශාස්ත්‍රීය හැදෑරීමක් වශයෙන් ගොනු කර ලේඛනගත කිරීමකි. එහෙත් දිවයිනේ විවිධ පළාත්වල මෙකී ශාස්ත්‍රීය ඥානය සමග බද්ධ නො වූ ඉහත කී භාණක ස්වරූපයේ විශේෂඥ භික්ෂූන් වහන්සේලා ද මෙරට විසූහ. ඔවුහු ප්‍රවේණිගත ඥානය පුස්කොළ පොත්වල සටහන් කොට තැබූහ. මේ නිසා ශ්‍රී ලාංකික අප සතු ව සාම්ප්‍රදායික ඥාන කෝෂ්ඨාගාර දෙකක් පවතී. ඉන් පළමුවැන්න සිංහල අත්පිටපත්වල ඇතුළත් වන ඥාන සමුදාය යි. දෙවැන්න බුද්ධඝෝෂ හිමියන්ගෙන් ප්‍රභවය වූ විග්‍රහාත්මක චින්තන ධාරාව යි. මෙයින් බුද්ධඝෝෂ හිමියන් ප්‍රමුඛ අර්ථකථන සම්ප්‍රදාය බොහෝ දුරට ශබ්ද විද්‍යාත්මක ලක්ෂණ කෙරෙහි ද අවධානය යොමු කොට ඇති බව අටුවාවල දක්නට ලැබෙන අර්ථකථන හා නිරුක්ති ආදිය විමසීමෙන් පෙනේ.[6] පුස්කොළ පොත්වල අන්තර්ගත වන්නේ එබඳු වෙනස්කම් රහිත ව කාලය විසින් කරන ලද යම් යම් සුළු වෙනස්කම් සහිත වූ ඥාන ධාරාවකි. එබැවින් අප විසින් ත්‍රිපිටක බුද්ධවචනය හැදෑරීමේ දී මෙකී උභය පාර්ශ්වයන් පිළිබඳ ව ගැඹුරු අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

පැරණි යතිවරයන් වහන්සේලා විසින් අප වෙත පවරා දී ඇති සම්ප්‍රදායගත බුද්ධිමය උරුමය සමීපාතීත සහ නූතන ශ්‍රී ලාංකේය භික්ෂූන් සහ බෞද්ධ අධ්‍යයනයේ නිරත පඬිවරුන් විසින් හඳුනාගෙන නොමැති යැයි කිවහොත් එය නිවැරදිය යනු මාගේ හැඟීම යි. මෙය යම් ප්‍රමාණයකට හෝ වටහාගත හැක්කේ ලංකාවේ පාලි අත්පිටපත් නැතහොත් පුස්කොළ පොත් සහ බුද්ධ ජයන්ති ත්‍රිපිටක සංස්කරණය සැසඳීමෙන් මෙන් ම ලෝකයේ වෙනත් බෞද්ධ රටවල පවතින විවිධ අත්පිටපත්, සංස්කරණ සහ බටහිර ජාතීන් විසින් කරන ලද සංස්කරණයන් විමසීමෙනි. ථෙරවාදී බුදුදහම ව්‍යාප්ත ව තිබෙන ආසියාතික රටවල් අතර **බුරුමය, කාම්බෝජය, ලාඕසය** හා **තායිලන්තය** යන රටවල් භෞගෝලීය බෙදීම් අනුව අයත් වන්නේ අග්නිදිග ආසියාවට ය. ශ්‍රී ලංකාව අයත් වන්නේ දකුණු ආසියාවට ය. මෙම රටවල්වල දැනට විද්‍යමාන පාලි අත්පිටපත් හා සංස්කරණ පරීක්ෂා කිරීමේ දී එම රටවල්වල විසූ භික්ෂූන් වහන්සේලා විසින් සුරක්ෂිත කරන ලද ත්‍රිපිටකයට අනුගත බුදුදහම හා බද්ධ වූ විශාල ඥාන සම්භාරයක් පවතී. එහෙත් ඒවායේ පෝෂණයට පසුකාලීන උගතුන් විසින් ප්‍රාමාණවත් දායකත්වයක් සපයා නැත. වෙනත් විධියකින් කිවහොත් අත්පිටපත්වල පවතින දැනුම් සම්භාරය ඔවුන්ගේ විදග්ධ විමර්ශන කෙරෙහි භාජනය වී නැත. කෙසේ වුවත් ශ්‍රී ලාංකික උරුමය පිළිබඳ ව සැලකීමේ දී ඉහත කී අග්නිදිග ආසියාතික ථෙරවාදී බෞද්ධ රටවලට ද වඩා පිරිසිදු පැහැදිලි හා නිවැරදි අනන්‍යතාවක් සහිත අත්පිටපත් දකුණු ආසියාතික රටක් වන ශ්‍රී ලංකාවේ සතු වීම විශේෂ කරුණකි. පහත දක්වනු ලබන කරුණු අනුව එය පැහැදිලි වනු ඇත.

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව වූකලී දැනට ශ්‍රී ලංකාවේ භාවිත ප්‍රධාන ත්‍රිපිටක සංස්කරණය වේ. එය මුද්‍රණද්වාරයෙන් ඉදිරිපත් කිරීම ශ්‍රී ලාංකික බෞද්ධ භික්ෂූන්ගේ උත්කෘෂ්ට ශාසනික කර්තව්‍යයක් ලෙස හඳුනාගත යුතු වේ. මෙම සංස්කරණය එවකට විසූ මහාප්‍රාඥ යතිවරුන් විසින් කරන ලද කාර්යයක් බව අපි දනිමු. එයින් එතෙක් සුලබ තත්ත්වයක නො පැවති ත්‍රිපිටකය මුද්‍රණද්වාරයෙන් එළි දැක්වීම නිසා ත්‍රිපිටකය බහුල භාවිතයට පත් වූ බව ද කිව යුතු ය. එහෙත් කෙටියෙන් කිවයුතු විශේෂ කරුණක් වන්නේ දැනට මුද්‍රිත ව පවතින මෙකී ත්‍රිපිටක සංස්කරණය හුදෙක් බුරුම සම්ප්‍රදාය අනුව සැකසී ඇති බව යි. සිංහල පුස්කොළ අත්පිටපත්වල දක්නට ලැබෙන ශ්‍රී ලංකික ථෙරවාද සම්ප්‍රදාය එහි නියෝජනය නො වීම බලවත් පාඩුවකි. මේ නිසා ලෝකයේ දැනට විශේෂයෙන් ඉංග්‍රීසි උගතුන් මුල්වී කරනු ලබන ත්‍රිපිටක සංස්කරණයන්හි දී මෙකී බුද්ධජයන්ති සංස්කරණය නො සලකා හැරීමක් සිදුවේ. මේ නිසා වර්තමානයේ අප සතු පුස්කොළ අත්පිටපත් පරිහරණය කරමින් ශ්‍රී ලාංකික අනන්‍යතාව තහවුරු වන පරිදි යළි ත්‍රිපිටක සංස්කරණයක් කිරීම ශාසන භාරධාරී යතිවරුන්ගේ සහ බෞද්ධ අධ්‍යයනය විෂයෙහි යොමු වී සිටින විශ්වවිද්‍යාලය වැනි ආයතනයන්හි කාර්යභාරයක් වනු ඇත. මෙම බුද්ධජයන්ති සංස්කරණය මෑත වකවානුවේ දී ශ්‍රී ලංකාවේ ස්ථාන දෙකක මූලිකත්වයෙන් පුනර්මුද්‍රණය කොට අලෙවි කෙරෙන බව ද මෙහි ලා සිහිපත් කිරීම සුදුසු ය.[7] එසේ ම තවත් ස්ථානයක මෙම සංස්කරණය ම ගලෙහි කොටා තැබීමට ද කටයුතු යෙදිණ. එහෙත් එම සංස්කරණවල පවතින මෙකී දෝෂ තත්ත්වයන් පිළිබඳ ව අවදියක් නො වීම සහ නව සංස්කරණයන් විෂයෙහි අවධානයක් නො වීම සැලකිය යුතු අඩුපාඩුවක් වේ. ඊට හේතුව මේ පිළිබඳ ව වියතුන් අතර ප්‍රමාණවත් සාකච්ඡාවක් නො පැවතීම විය හැකි ය. එබැවින් මෙම කරුණ පරීක්ෂා කිරීම සඳහා මෙරට විවිධ පළාත්වලින් සොයාගන්නා ලද අත්පිටපත් රාශියක් පරීක්ෂා කරන ලද බව ද සඳහන් කළ යුතු ය. මෙම ලිපියෙහි ඇතුළත් කරුණු දක්වනු ලබනුයේ දීඝනිකායේ පමණක් අත්පිටපත් විසි නවයක් සසඳා බලමින් ඒවායින් විෂමතා සහිත පිටපත් තුනක් පමණක් අදාළ කර ගනිමිනි. මෙසේ අත්පිටපත් තුනක් පමණක් අදාළ කර ගැනීම සාධාරණ වන්නේ සමස්තයක් වශයෙන් ගත් කල ඒවායේ සමාන ලක්ෂණ දක්නට ලැබෙන හෙයිනි. එහෙයින් සිංහල අත්පිටපත් එකිනෙකට වෙනස් යැයි වැරදි නිගමනයකට එළඹිය යුතු නො වේ.

ඉහත කී අත්පිටපත් තුනෙන් පළමුවැන්න සරණංකර සාමීන්ගේ ශිෂ්‍ය වූ තිබ්බටුවාවේ සාමණේරයන් විසින් ලියන ලද කුරුණෑගල රිදී විහාරයට අයත් දීඝනිකායේ සිංහල අත්පිටපත ක්‍රි.ව. 1744 වර්ෂයට අයත් වන්නකි. එය මෙහි ලා SL1 වශයෙන් දක්වමු. දීඝනිකායේ අනෙක් සිංහල අත්පිටපත වැල්ලේවත්තේ පදිංචි හෙට්ටිගේ අම්බයසිංහ වීරකෝන් ගෝමිස් අප්පුහාමි විසින් ලියන ලද්දක් වන අතර එය දැනට මාතර වල්ගම කොටිකාගොඩ රජමහ විහාරය සතු වූවකි.

එම අත්පිටපත ක්‍රි.ව.1832 වර්ෂයට අයත් වන අතර මෙහි ලා එය SL2 වශයෙන් දක්වනු ලැබේ. තෙවැන්න ක්‍රි.ව. 1855 දී අයගම අත්ථදස්සී උන්නාන්සේ විසින් ලියන ලද දීඝනිකායේ අනෙක් අත්පිටපත SL3 යනුවෙන් දැක්වෙන අතර එය මහනුවර කුණ්ඩසාලේ ශ්‍රී නරෙන්‍ද්‍රසිංහ රජමහ විහාරය සතු ව පවතී. මේ සඳහා ඉහත කී සිංහල අත්පිටපත්වලට අමතර ව භාවිත කරන ලද අත්පිටපත් හා සංස්කරණ ද ඒවායේ සංකේත නිරූපණ ද පහත දැක්වේ.

| | |
|---|---|
| BM1 | බුරුම අක්ෂර අත්පිටපත 1, ක්‍රි.ව. 1846, මධ්‍යම පුස්තකාලය, යැංගුන් විශ්වවිද්‍යාලය |
| BM2 | බුරුම අක්ෂර අත්පිටපත 2, ක්‍රි.ව. 1840, මධ්‍යම පුස්තකාලය, යැංගුන් විශ්වවිද්‍යාලය |
| KM | කෙමා අක්ෂර අත්පිටපත, වට් පෝ, බැංකොක්, තායිලන්තය |
| LM | තම් ලන්නා අක්ෂර අත්පිටපත, ක්‍රි. ව. 1936, වට් සුන් මෙන් ප්‍රා, තායිලන්තය |
| MM | මොන් අක්ෂර අත්පිටපත, (අනෙක් තොරතුරු අවිද්‍යමානය) |
| Cscd | බුරුමයේ ඡට්ඨ සංගායනා සංස්කරණය 1956, (සංයුක්ත තැටිය) |
| SLe | දීඝනිකාය බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව, 2005, පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය |
| Ke | දීඝනිකාය, පුනර් මුද්‍රණය, 1994, කාම්බෝජයේ Phnom Penh Buddhist Instituteහි සංස්කරණය |
| Se | දීඝනිකාය ස්‍යාමරට්ඨස්ස තෙපිටකං, 2009 පුනර්මුද්‍රණය, මහාමකුට් රාජවිද්‍යාලය, |
| PTS | Dīghanikāya, Pāli Text Society (2006 reprint) |

මේ අනුව බුරුම, කාම්බෝජ, තායිලන්ත, ලාඕස් සහ මොන් අත්පිටපත් හා සංස්කරණ ද මේ සඳහා භාවිත කෙරෙන අතර එංගලන්තයේ මුද්‍රිත ඉංග්‍රීසි සංස්කරණ ද අදාළ කරගැනේ. ඒවා නිසි පරිදි කියවා ගනිමින් සංසන්දනය කොට සංකේත නිරූපණ මගින් දක්වා ඇත. ඉහත සංස්කරණ පිළිබඳ ව දතයුතු කරුණක් ඇත. එනම් මේවා සියල්ල විවිධ අක්ෂරවලින් ලියා තිබීම සම්බන්ධ ව යි. විශේෂයෙන් තායිලන්තයේ වර්තමාන ත්‍රිපිටක සංස්කරණ මුද්‍රණය වී ඇති අක්ෂරවලට වඩා හාත්පසින් වෙනස් වූ අක්ෂර සමුදායක් පැරණි තායි බසට හිමි ය. එම අක්ෂර හඳුන්වනු ලබනුයේ තම් (Tam) අක්ෂර නමිනි. ලාඕස් අත්පිටපත් ඇත්තේ ද එම අක්ෂරවලින් බව ද දත යුතු ය.

ශ්‍රී ලංකාවේ නැවත ත්‍රිපිටක සංස්කරණයක් කෙරෙනුයේ නම් ඉහත දක්වන ලද අත්පිටපත් හා සංස්කරණ ද යොදා ගනිමින් ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු වන පරිදි කිරීමේ අවශ්‍යතාවක් හා හැකියාවක් පවතී. දැනට වෙනත් රටවල් දෙකක තුනක පමණක් සිදුවෙමින් පවතින සංස්කරණයන් ද එහි ලා පවතින ප්‍රාමාණිකත්වය අනුව අනාගතයේ දී භාවිත කිරීමේ හැකියාවක් තිබිය හැකි ය. එහෙත් එකී සංස්කරණ සම්ප්‍රදායවාදීන්ගේ හා ශබ්ද විද්‍යාත්මක ලක්ෂණ ප්‍රාමාණික කොට ගනිමින් නිගමනවලට එළෙඹෙන බටහිර වියතුන්ගේ අදහස්වලින් කුළුගැන්වෙන හෙයින් විශ්වාසනීයත්වය පිළිබඳ ගැටලු පැන නැඟේ. චීන සංස්කරණ ආදිය ද වැදගත් වන නමුත් මෙහි ලා ඒවා පිළිබඳ ව සඳහන් නො කෙරෙනුයේ මෙම අධ්‍යයනය ථෙරවාද පසුබිමක සිට සිදු කෙරෙන්නක් බැවිනි. ශ්‍රී ලංකාවේ පාලි අත්පිටපත්වල වටිනාකම වටහා ගැනීම පිණිස පහත නිදසුන් කිහිපය දක්වනු ලැබේ. කරුණු ගෙනහැර දැක්වීමේ සහ අවබෝධයේ පහසුව පිණිස දීඝනිකායේ සූත්‍ර කීපයක් ඇසුරින් පමණක් කරුණු ගෙනහැර දක්වනු ලැබේ.

## සුරාමෙරයමජ්ජපමාදට්ඨානා[8]

මෙම වචනය පාලි සූත්‍රවල ක්‍රම දෙකකට භාවිත වේ. එනම් **සුරාමෙරයමජ්ජපමාදට්ඨානා** සහ **සුරාමෙරයමජ්ජප්පමාදට්ඨානා** යනුවෙනි. මෙයින් බුද්ධ ජයන්ති සංස්කරණයෙහි භාවිත වන්නේ **සුරාමෙරයමජ්ජප්පමාදට්ඨානායන** වචනය යි. එහෙත් සිංහල අත්පිටපත්වල භාවිත වන්නේ සුරාමෙරයමජ්ජපමාදට්ඨානා යනුවෙනි. **ධම්මානුධම්මපටිපත්ති** යනුවෙන් අත්පිටපත්හි යෙදෙන පදය බුද්ධ ජයන්ති සංස්කරණයෙහි යෙදෙනුයේ **ධම්මානුධම්මප්පටිපත්ති**[9] යනුවෙනි. **ධම්මානුධම්මපටිපන්නො**[10]යන පදය බුද්ධජයන්ති සංස්කරණයෙහි එක ම කොටසෙහි **ධම්මානුධම්මපටිපන්නො** සහ **ධම්මානුධම්මප්පටිපන්නො**[11] යනුවෙන් භාවිත වුවත් බොහෝ අත්පිටපත්වල ඇත්තේ **ධම්මානුධම්මපටිපන්නො**[12] යනුවෙනි. තව ද **උප්පන්නො**[13] යනුවෙන් අත්පිටපත්හි යෙදෙන පදය බුද්ධ ජයන්ති සංස්කරණයෙහි **උප්පන්නො** සහ **උපපන්නො** දෙයාකාරයට ම යෙදේ.[14] මෙහි නිවැරදි රූපය කුමක් ද? ව්‍යාකරණමය වශයෙන් **සුපටිපන්නො** සහ **සුප්පටිපන්නො** යන පද දෙකෙහි ම වරදක් නැත. එහෙත් පැරණි හා වඩාත් නිවැරදි රූපය සොයා ගැනීම ශාස්ත්‍රීය කාරණයක් වේ. සප්‍රතිපන්න යන සංස්කෘත රූපය පාලියට පැමිණිය යුතු වන්නේ **සුප්පටිපන්න** යනුවෙනි. මෙම රීතිය අනුව සිංහල අත්පිටපත්වල හැර අනෙක් සියලු රටවල අත්පිටපත්වල යෙදෙනුයේ **සුප්පටිපන්නො, උජුප්පටිපන්නො, ඤායප්පටිපන්නො, සාමීචිප්පටිපන්නො**[15]යනාදි වශයෙන් සංයුක්ත ලක්ෂණ සහිත ව ය. එහෙත් සියලු සිංහල අත්පිටපත්වල මෙය භාවිත වන්නේ **සුපටිපන්නො උජුපටිපන්නො** යනාදි වශයෙන් සංයුක්ත අක්ෂරය තනි වීමෙනි. මෙය මුළුමනින් ම උච්චාරණ විශේෂතාවක් හේතුවෙන් සිදු වන්නකි. බුරුම සියම් ආදි රටවල සුබෝච්චාරණය වන්නේ එබඳු තැන්වල එසේ

සංයුක්ත ව කීම යි. එතෙකුදු වුවත් ශ්‍රී ලංකාවේ උච්චාරණ රටාවට විසංයුක්ත ව කීම බාධකයක් නො වේ. සංඛ්‍යාත්මක ව විසිනවයක් වන දීඝනිකායේ සිංහල පුස්කොළ අත්පිටපත්වලින් තුනක හැර අනෙක් සියලු අත්පිටපත්වල එකසේ ම සුපටිපන්නො යනුවෙන් විසංයුක්ත ව යෙදෙනුයේ එහෙයිනි. අනෙක් අතින් සංයුක්තාක්ෂර තනිවීම අශෝක ප්‍රාකෘතය (සිංහල) වැනි මධ්‍ය ඉන්දු ආර්ය භාෂාවල ලක්ෂණයකි. තව ද පාලි භාෂාව පිළිබඳ සියලු භාවිතයන් සංස්කෘතයට අනුව ම පරීක්ෂා කිරීමට යාම නුවණැති ක්‍රියාවක් ද නො වේ. බුද්ධජයන්ති සංස්කරණයෙහි මෙම ක්‍රම දෙක ම අනුව පද යොදා ඇත.

## අවිවරදන්තො

බුදුරදුන්ගේ දෙතිස් මහාපුරුෂ ලක්ෂණ දක්වන දීඝනිකායේ ලක්ඛණ සූත්‍රයෙහි බුද්ධ ජයන්ති සංස්කරණයට අනුව අවිරළදන්තො[16] යනුවෙන් පදයක් හමුවේ. සියම්, බුරුම හා කාම්බෝජ පුස්කොළ අත්පිටපත්වල මෙන් ම මුද්‍රිත සංස්කරණවල ද මෙය එලෙස ම දක්නට ලැබේ. එහෙත් ශ්‍රී ලංකාවේ පාලි අත්පිටපතෙහි පමණක් මෙය අවිවරදන්තො[17] යනුවෙන් යොදා ඇත. **අවිරළදන්තො, අවිවරදන්තො** යන පදද්වයෙන් වාඩාත් සුදුසු වන්නේ කුමක් ද?. විරල යන පාලි වචනයේ ප්‍රකට තේරුම දුර්ලභ යන්න යි. පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂවල ඒ සඳහා අරුත් දීමට sparse, rare, thin වැනි වචන යොදා ඇත. විරල, දුරින් දුර පිහිටි, අතරින් පතර, සිහින් යනාදි තේරුම් එයින් කියැවේ. එබැවින් අවිරල යන්නෙන් එකී තේරුම්වල ප්‍රතිවිරුද්ධ අරුත් ලැබේ. දුරින් දුර හෝ අතරින් පතර නො පිහිටි, විරල නො වූ යනාදි වශයෙනි. අටුවාවල අවිරල යන්නට ඒවායෙහි අරුත් දක්වා ඇත්තේ ළඟින් පිහිටි දත් ඇති (having closely set teeth)[18]යනුවෙනි. **අඤ්ඤෙසං කුම්භිලානං විය දන්තා විරළා හොන්ති. මච්ඡමංසානි ඛාදන්තානං දන්තන්තරං පූරෙන්ති. ඉමස්ස පන කනකඵලකායං සමුස්සිතවජිරපන්ති විය අවිරළා තුලිකාය දස්සිතපරිච්ඡෙදො විය දන්තා භවිස්සන්ති**[19] "අන් අයගේ දත් කිඹුලන්ගේ මෙන් ඈතින් පිහිටියේ වෙයි. මාලු මස් කන කල්හි දත් අතර පිරේ. බුදුරදුන්ගේ දත් වනාහි රන් එලකයක ඔසවන ලද විදුරු පෙළක් මෙන් ඈත් නො වූයේ, පින්සලකින් ඇඳ දක්වන ලද වෙන් කිරීමක් වැනි දත් ඇත්තේ වේ'' යනුවෙනි. සිංහල අත්පිටපත්හි යෙදෙන අවිවරදන්ත යන්න වඩාත් යෝග්‍ය වන්නේ බුදු මුවෙහි දත්වල ස්වභාවය ඊට වඩා ගැඹුරින් ඒවායෙහි අරුත් ගන්වන හෙයිනි. විවර යන්නෙහි විවෘත, කුහර, සිදුර, හිඩැස් යනාදි අරුත් රාශියක් ඇත. එබැවින් අවිවරදන්තො යන්නෙහි දත් අතර හිඩැස් නැති, විවර නොමැති, මුළු දත විවෘත නො වූ යන අදහසක් එහි වේ. මේ නිසා පෙර කී අදහස්වලට වඩා හිඩැස් හෝ කුහර නොමැති දත් යන අරුත් ගැළපේ. ඉංග්‍රීසි සංස්කරණවල ද තෝරාගෙන ඇත්තේ මෙකී සිංහල අත්පිටපතේ භාවිතය යි.[20] එහෙත් බුද්ධජයන්ති සංස්කරණය සඳහා තෝරාගෙන ඇත්තේ අපගේ අත්පිටපත්වල යොදා ඇති පදය නො ව වෙනත් සම්ප්‍රදායවල (BM,

KM, TM, Be, Ke, Se) භාවිතයන් ය. එහෙයින් අප විසින් ලංකාවේ පැරණි පාලි අත්පිටපත්වල ශාස්ත්‍රීය නිරවද්‍යතාව කෙරෙහි දක්වන විශ්වාසයට වඩා බලවත් විශ්වාසයක් ඉංග්‍රීසි උගතුන් (P.T.S) කරන ලද බව පෙනේ.

**සුඛම්භියො**

ඉහත කී සූත්‍රයෙහි ම මෙබඳු තවත් පාඨ දක්නා ලැබේ. **රාජා සමානො කිං ලභති? අවික්ඛම්භියො හොති කෙනචි මනුස්සභූතෙන පච්චත්ථිකෙන පච්චාමිත්තෙන.**[21] (රජෙක් වූයේ කුමක් ලබයි ද? සතුරු පසමිතුරෙකු කිසිවෙකු විසින් නො මැඩලිය හැක්කේ වේ.) බුද්ධජයන්ති සංස්කරණයෙහි යොදා ඇති **අවික්ඛම්භියො** යන්න සංකීර්ණ පදයකි. විවිධ සංස්කරණවල මේ සඳහා යොදනු ලබන පද කිහිපයක් වේ. **අඛම්භියො**[22], **අක්ඛම්භියො**[23], **අවික්ඛම්භියො**[24], **සුඛම්භියො**[25] (C, PTS) යනු ඒ පද යි. මෙම පදවලින් බුද්ධජයන්ති සංස්කරණය සඳහා තෝරාගෙන ඇත්තේ බුරුම, සියම් ආදි සම්ප්‍රදායයන්හි අත්පිටපත්වල භාවිත වන අවික්ඛම්භියො යන පදය යි. සිංහල පුස්කොළ අත්පිටපතෙහි සුඛම්භියො යන භාවිතය බුද්ධජයන්ති සංස්කරණය අත්හැර ඇත. එතෙකුදු වුවත් (PTS) ඉංග්‍රීසි සංස්කරණයේ දී පිළිගෙන තිබීම වැදගත් කරුණකි. බුද්ධජයන්ති සංස්කරණකරුවන් බුරුම සම්ප්‍රදාය ගුරුකොට ගැනීම මෙයට හේතුව ලෙස පෙනී යයි. සිංහල අත්පිටපත සෙසු අත්පිටපත්වලට වඩා විශ්වාසනීය වන්නේත් එය සුරක්ෂිත කළ යුතු වන්නේත් කවර හෙයින් ද යන්න සංස්කරණ කාර්යයක දී තේරුම් ගත යුත්තකි. හුදු අක්ෂර දෝෂ ආදිය පමණක් ශුද්ධ කරවා ගැනීම එහි එක ම අභිප්‍රාය නො වේ. එම පද පාඨ ආදිය ශෝධනය කළ යුතු වන්නේ එයින් බුද්ධවචනය හෝ අදාළ පසුබිමේ එන පදයෙන් හෝ පාඨයෙන් හෝ කියැවෙන අදහසට ආලෝකයක් සපායා ගනු උදෙසා ය. නිදසුනක් ලෙස අනෙක් සම්ප්‍රදායයන් තෝරාගත් ඉහත දක්වා ඇති අවික්ඛම්භයො සහ සිංහල අත්පිටපත්වල යෙදෙන සුඛම්භියො යන පදද්වය බලන්න. **අවික්ඛම්භියො** යන පදය පාලියට පැමිණිය හැක්කේ අවිෂ්කම්බ යන පදය ඇසුරෙනි. එසේ වුවහොත් එහි බිය යන අරුතක් නො කියැවේ.

**විෂ්කම්බ** යන පදය පුළුල් වීම, ප්‍රසාරණය වීම යන අරුත් ඇති හෙයිනි. එනයින් සිංහල අත්පිටපතේ එන සුඛම්භියො යන පදය වඩාත් අරුත්බර වේ. සුඛං - භීයො යනපදද්වය එකතුවී සැදෙන සුඛම්භියො යන පදය සුවසේ හෝ ලෙහෙසියෙන් හෝ බිය කළ හැක්කෙක් නො වන්නේය යන අරුත් කියැවෙන බැවිනි. රජවරු ද කෙලෙස් සහිත පුද්ගලයන් බැවින් බියට පත් කළ නො හැක්කෝ නො වෙති. එහෙත් ඔවුන් පහසුවෙන් බිය කළ හැකි නො වේ. මේ නිසා ඉහත දැක්වූ **අඛම්භියොල අක්ඛම්භියො, අවික්ඛම්භියො** යන පද අතුරෙන් වඩාත්ම සුදුසු පදය සිංහල අත්පිටපත්වල යෙදෙන **සුඛම්භියො** යන්න යි.

## සහත්ථා වන්දිස්සති

සංස්කරණයක උපයෝගිතාව වඩාත් වැඩි වන්නේ එය බුද්ධවචනය හෝ කිසියම් සංසිද්ධියක අර්ථෝද්දීපනය සඳහා උපකාරී වන්නේ නම් පමණකි. නිදසුනක් ලෙස දීඝනිකායේ මහාපරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් වන පරිදි මහාකාශ්‍යප තෙරුන් තථාගතයන් වහන්සේට නමස්කාර කරන තුරු උන්වහන්සේගේ චිතකය නො දැල්වුණි මහාකාශ්‍යප තෙරුන් බුදුරදුන්ගේ පා අල්වා වැඳි පසුව එය සිදු විය.[26]එම අවස්ථාව දක්වන සූත්‍රයේ **භගවතො පාදෙ සිරසා න වන්‍දිස්සතීති**[27]යනුවෙන් සඳහන් වන පාඨයේ සිරසා (සිරසින්) යන යෙදුම කිහිප තැනක ම දක්නා ලැබේ. සිංහල අත්පිටපත්වල ඇත්තේ සහත්ථා[28] (සියතින්) යනුවෙනි. සිරසා යනුවෙන් යෙදීම පාලි සාහිත්‍යයේ බහුල භාවිතය වුවත් බුදුරන්ගේ පිරිනිවන් පෑ අවස්ථාව සම්බන්ධ අසිරිමත් හෝ ගුප්තමය සිදුවීම ද එම සිද්ධීන් මෙම සූත්‍රයෙහි සටහන් වන කාලය ද සලකා බැලීමේ දී සාම්ප්‍රදායික පාලි රීතිය ඉක්මවා ගිය විශේෂ සටහන් කිරීමක් ලෙස මෙම අවස්ථාව සැලකිය හැකි ය. මහාකාශ්‍යප හිමියන් චිතකයෙහි ගිනි දැල්වීම දක්වා සියල්ල සියතින් ම සිදු කළ බව සඳහන් වේ. සිංහල අත්පිටපත්හි සිරසා යනුවෙන් යෙදීමට වඩා සහත්ථා යනුවෙන් යෙදීම විශේෂ වන්නේ ඒ නිසා ය. මෙය සිංහල භික්ෂූන් විසින් නො දැන කරන ලද භාවිතයක් නො වේ. සිංහල පුස්කොළපොත් 20කින් 17ක ම සහත්ථා යනුවෙන් තිබීමෙන් ම මෙය සවිඤ්ඤාණක ව යොදන ලද්දක් බව පැහැදිලි වේ. මේ නිසා සිංහල අත්පිටපත් වැදගත් වන්නේ සිදුවීම සටහන් කිරීම නිසා හෝ පාලි රීතිය ආරක්ෂා කිරීම නිසා පමණක් හෝ නො වේ. ඒවායේ සංකේතාත්මක, ඓතිහාසික හා දාර්ශනික විභවයන් ද ප්‍රකාශ වන පරිදි ඥාන සමුදාය පවත්වා ගෙන ආ හෙයිනි. මෙබඳු පසුබිම් බටහිර උගතෙකුට වටහා ගැනීම අපහසු වන්නේ ඔවුන් ශබ්ද විද්‍යාත්මක ව පමණක් මේවා හදාරන හෙයිනි. ශ්‍රී ලංකාවේ හෝ ඉන්දියානු සංස්කෘතිය ආත්මගත වූවෙකුට මෙය පහසුවෙන් වටහා ගත හැකි ය. එබැවින් කිවයුතු වන්නේ සහත්ථා යනුවෙන් සිංහල අත්පිටපත්වල යෙදෙන පදයේ සන්දර්භීය වටිනාකමක් පවතින බව යි.

## පාඨ ඇතුළත් කිරීම හා ඉවත් කිරීම

බුද්ධජයන්ති ත්‍රිපිටක සංස්කරණයෙහි සිංහල අත්පිටපත් දක්නට ලැබෙන ඇතැම් පාඨ ඇතුළත් කිරීම් හා ඉවත් කිරීම් දක්නට ලැබෙන බව කිව යුතු ය. නිදසුනක් ලෙස දීඝනිකායේ පාසාදික සූත්‍රයේ සත්තා ච තෙ **අරහං සම්මාසම්බුද්ධො**[29] යනුවෙන් අත්පිටපත්හි යෙදී ඇති පාඨය බු.ජ. සංස්කරණයෙහි **සත්තා ච තෙ සම්මාසම්බුද්ධො**[30] යනුවෙන් යෙදා ඇත. එහි අරහං යන පදය ඉවත් කොට ඇත. එසේ ම අත්පිටපත්හි **චුන්ද සම්මා වදමානා වදෙය්‍යසබ්බාකාරසම්පන්නං**[31]යන්න බු.ජ. සංස්කරණයෙහි **චුන්ද සම්මා වදමානා වදෙය්‍ය**[32]යනුවෙන් යෙදේ. මෙබඳු තැන්හි පද අත්හැරීම කරන ලද්දේ කවර හේතුවක් නිසා ද යන්න පැහැදිලි නැත. බුරුමයේ දී පවත්වන ලද ෂට්ඨ සංගායනාවට සහභාගි වූ භික්ෂූන් වහන්සේලා

එහි දී එළඹි නිගමන අනුව මෙසේ කරන්නට ඇතැයි සිතිය හැකි ය. කෙසේ වුවත් අපට පෙනෙන කරුණ වන්නේ සිංහල අත්පිටපත්හි පාලි රීතිය ද ආරක්ෂා වන හෙයින් එසේ ඉවත් කිරීම යුක්තියුක්ත නැති නො වන බව යි.

මෙලෙසින් ම ඇතැම් අවස්ථාවල අත්පිටපත්වල දක්නට නොමැති පද බු.ජ. සංස්කරණයට ඇතුළත් වී තිබීම ද ගැටලු සහිත ය. යථෝක්ත සූත්‍රයෙහි ම අත්පිටපත්හි අන්තරධානන්ති[33] යනුවෙන් යෙදී ඇති නමුත් බු.ජ. සංස්කරණයෙහි **අන්තරධානං හොතීති** යනුවෙන් වෙනත් අත්පිටපත් අනුව යමින් පද ඇතුළත් කොට ඇත. තව ද අත්පිටපත්හි එවං **දිට්ඨිනො අසස්සතො අත්තා ච ලොකො** ච යන්න බු.ජ. සංස්කරණයෙහි එවං **දිට්ඨිනො සස්සතො අත්තා ච ලොකො චඅසස්සතො අත්තා ච ලොකො ච**[34] යනුවෙන් යම් යම් වාක්‍ය පාඨ හෝ පද හෝ ඡේද එකතු කරනු ලබන අවස්ථා ද දක්නට ලැබේ. මීට අමතර ව ඇතැම් තැන්වල පද පිළිවෙළ මාරුවීම් දක්නට ලැබේ. නිදසුනක් ලෙස සිංහල **අත්පිටපත්හි ඉද්ධං චෙව හොති** යනුවෙන් දක්නට ලැබෙන පාඨය බු.ජ. සංස්කරණයෙහි **හොති ඉද්ධඤ්චෙව**[35] යනුවෙන් ද අත්පිටපත්හි **සදෙවකෙ චුන්ද ලොකෙ සමාරකෙ** යන්න බුද්ධජයන්ති සංස්කරණයෙහි **සදෙවකෙ ලොකෙ චුන්ද සමාරකෙ**[36] යනුවෙන් ද යොදා ඇත. එවකට දෙරට අතර පැවති සම්බන්ධය සහ කාලය, සම්පත් ඌනතාව ආදි වෙනත් විශේෂ මෙයට බලපාන්නට ඇත. පහත දැක්වෙන වගුව බලන්න.

| සිංහල අත්පිටපත් MM | වෙනත් අත්පිටපත් හා සංස්කරණ | බුද්ධජයන්ති සංස්කරණය | ඉංග්‍රිසි සංස්කරණය PTS edition |
|---|---|---|---|
| බ්‍රහ්මුප්පුගත්තො | බ්‍රහ්මුපුගත්තො (BM, TM, Be, SLe. Ke, Se)<br>බ්‍රහ්මුප්පුත්තතො (MM) | බ්‍රහ්මුපුගත්තො | බ්‍රහ්මුප්පුගත්තො |
| ව්‍යඤ්ජන | බ්‍යඤ්ජන | බ්‍යඤ්ජන | ව්‍යඤ්ජන |
| සබ්බකාමගුණභොගං | සබ්බකාමභොජනං (BM)<br>සබ්බකාමභොගං (KM, TM, MM, Be, Ke, Se) | සබ්බකාමභොගං (252 පිට) | සබ්බකාමගුණභොගං |
| සංවින්දති<br>සවින්දති (ඇතැම්) | වින්දති (BM, KM, TM, MM, Be, Ke, Se) | වින්දති | සංවින්දති |
| කයිරමානං | කයිරමානං(BM, KM, TM, MM) | කරීයමානං (Ke, Se) | කයිරමානං |
| නවනවතියො | නවනවතියො (KM, LM, Ke.Se) නවවුතියො(BM) | නවනවුතියො | නවනවුතියො (Be) |

මෙම වගුවේ දැක්වෙන පාලි අත්පිටපත්වල යෙදුම්වලින් පැහැදිලි කරුණු කිහිපයක් ඇත.

1. ශ්‍රී ලංකික ථෙරවාද සම්ප්‍රදාය සතු වන පැරණි පුස්කොළ අත්පිටපත් පිළිබඳ ශ්‍රී ලංකික උගතුන්ගේ අවධානය යොමු වී නැත.

2. දැනට ලෝකයේ උගතුන් විසින් වඩාත් ප්‍රාමාණික ත්‍රිපිටක සංස්කරණයක් වශයෙන් සලකනු ලබන එංගලන්තයේ පාලි මූල ග්‍රන්ථ සමාගම මගින් කළ සංස්කරණයේ දී පවා වඩාත් ප්‍රාමාණිකත්වයෙන් සලකා ඇත්තේ ශ්‍රී ලංකාවේ අත්පිටපත් බව.

3. බුද්ධජයන්ති සංස්කරණයේ දී ශ්‍රී ලාංකික අනන්‍යතාව හා දේශභාෂා භාවිතයන් තහවුරු නො වන බව.

4. තථාගත දේශනා සංරක්ෂණය කිරීමේ උරුමය සහ ථෙරවාද සම්ප්‍රදායේ මූලස්ථානය වශයෙන් ලබා ඇති උරුමය සහ කීර්තිය රැක ගැනීමත් අපගේ කාර්භාරයක් බවය.

මිහිඳු හිමියන් විසින් ලංකාවට අටුවා සහිත ත්‍රිපිටකය රැගෙන ආ බව ඓතිහාසික ලේඛනවල සඳහන් වන කරුණකි.[37] එබැවින් පෙළ හා අටුවා පිළිබඳ දේශීය ව්‍යවහාර සහිත ව නිවැරදි ව පවත්වාගෙන ආ මුඛපරම්පරාගත ක්‍රමවේදයක් අපට පැවති බවට සාධක අනවශ්‍ය වේ. පැරණි ශ්‍රී ලාංකික යතිවරුන් එකිකෙනා උච්චාරණය කරමින් සසඳමින් මෙම ක්‍රමවේදය පවත්වාගෙන ආ බව සඳහන් වේ. එම කාර්යය සඳහා කැපවූ භික්ෂූන් අතර **ඉසිදත්ත** හා **චූලසිව, මහාසොණ** යන තෙරවරුන්ගේ නම් අටුවාව විශේෂයෙන් සිහිපත් කොට ඇත.

ක්‍රි.ව. 5 සියවස අටුවා සම්පාදනය වීමෙන් මහාවිහාරය පසුබිම් කොට නව ඥාන කෝෂ්ඨාගාරයක් බිහි වුව ද ඊට සමගාමී වශයෙන් මෙබඳු අත්පිටපත් ඔස්සේ පැරණි ඥානය ද සුරක්ෂිත වූ බව පැහැදිලි ය. පාලි පුස්කොළ අත්පිටපත්වල ඇත්තේ එකී ඥානය යි. බුද්ධජයන්ති සංස්කරණය තුළ එය ඇතුළත් වන ප්‍රමාණය පහත දැක්වෙන වගුවේ ඇතුළත් කරුණු මගින් හඳුනා ගත හැකි ය.

### වෙනස්වීම් බහුලත්වය

| පරි | සිංහල අත්පිටපත් | බු.ජ. |
|---|---|---|
| 4 | නචාහං | නහි |
| 4 | දුක්ඛක්ඛයාය | දුක්ඛක්ඛයායාති |
| 5 | පඤ්ඤාපෙතීති | පඤ්ඤපෙතීති |
| 7 | අථ ඛොහං | අථ ඛ්වාහං |
| 7 | කොරක්ඛත්තිකො | කොරක්ඛත්තියො |
| 7 | ඡමානික්කිණ්ණං | ඡමානිකිණ්ණං |
| 7 | ව්‍යාකතො | බ්‍යාකතො |
| 11 | පතිසෙවෙය්‍යං | පටිසෙවෙය්‍යං |
| 13 | පරිහීනො | පරිහිතො |
| 15 | පාටිකපුත්තො | පාතිකපුත්තො |
| 15 | තද්දිගුණං | තන්දිගුණං |
| 19 | තාවතිංසහි කායං | තාවතිංස කායම්හි |
| 26 | සචෙපි ආයස්මන්තානං | සචෙ පායස්මන්තානං |
| 30 | විම්පාසෙ | විසාසෙ |
| 34 | ජාලෙත්වා | පජ්ජලිත්වා |
| 35 | යථෙවාහං තෙ | යථෙව තෙ අහං |

මේ හැරුණු විට සිංහල අත්පිටපත්වල **මහානිදාන, මහාසුදස්සන** ආදි සූත්‍රයන්හි **ගුළාගුණ්ඨිකජාතා** යනුවෙන් සඳහන් වන පදය කුළාගුණ්ඨිකජාතා හා **කුළාකුණ්ඨිකජාතා** යන දෙවිධියෙන් බුරුම අත්පිටපත්වල යෙදේ. එය ම කාම්බෝජ අත්පිටපත්වල දැක්වෙන්නේ **ගුණගණ්ඨිකජාතා** හා **ගුණගණ්ඨිතජාතා** යන පදද්වයෙනි. මෙම පදයෙන් අදහස් වන්නේ රෙදිවලට දමන කැඳ විශේෂයක් බව කියැවේ. ශ්‍රී ලාංකික සම්ප්‍රදායේ **භද්ධො හත්ථාජානියො** යනුවෙන් දක්වන පදය **ගන්ධො හත්ථාජානියො** යනුවෙන් බුරුම සම්ප්‍රදායේ එයි. වෙනත් සම්ප්‍රදායන්හි **විසුකම්ම** යනුවෙන් සඳහන් පදය අපගේ සම්ප්‍රදායෙහි සඳහන් කරනුයේ **විස්සකම්ම** යනුවෙනි. **ජනවසභ, බන්ධපරිත්ත** ආදියෙහි හමුවන **නහ නූන සො...** යන ප්‍රයෝගය සිංහල අත්පිටපත්වල මෙන් ම වේදයට ද අයත් භාවිතයකි. මෙය වෙනත් සම්ප්‍රදාය සටහන් කරනුයේ නහි නූන සො.. යනාදි වශයෙනි. **කම්මාස්සධම්ම** යනුවෙන් මජ්ඣිමනිකාය අටුවාවේ දී බුද්ධඝෝස හිමියන් විසින් නිර්වචනය කරනු ලබන පදයක් වේ. කර්ම හෙවත් වැඩ මොහුගේ ස්වභාවය යන අදහස දීම සඳහා මෙම පදය තෝරාගෙන ඇත. එයින් බුද්ධඝෝෂ හිමියන් ඉස්මතු

කිරීම උත්සාහ කරනුයේ කුරු ජනපදයෙහි මිනිසුන් අනලස් ජන කොටසක් බව පැවසීම යි. එහෙත් සිංහල පුස්කොළ අත්පිටපත්වල යෙදෙනුයේ **කම්මාස්සදම්ම** යනුවෙනි. මෙම පදය ද සංස්කෘත මූලයන් අනුව විශ්ලේෂණය කළ හොත් ඉහත කී පරිදි විවිධ අරුත් දැනවිය හැකි ය. එහෙත් එයින් ආරෝපිතාර්ථයක් මිස එම පදයෙහි ගැබ්වන සත්‍යය එයින් ස්ඵුට වන්නේ නැත. මෙබඳු පද රාශියක් සොයාගත හැකි ය. මේවායින් තහවුරු වන්නේ සිංහල සම්ප්‍රදාය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අප ඉදිරියේ ශේෂ ව ඇති කාර්යයභාරය පුළුල් බව යි.

පාලි අත්පිටපත් සහ සංස්කරණ පිළිබඳ ව මෙන් ම අටුවාටීකාගත අර්ථෝද්දීපනයන් ද පෙරදිග හා බටහිර නූතන ශාස්ත්‍රීය අධ්‍යයනයන්ගේ නිගමනයන් ද ඇතැම් අවිඥ පුද්ගලයන්ගේ මනඃකල්පිත විවරණයන්ගේ ද නිරවද්‍යතාව නිර්ණය කිරීමෙහි එක් වැදගත් උපායික මාර්ගයක් වනුයේ ශබ්ද විද්‍යාත්මක නයින් බුද්ධවචනය විශ්ලේෂණය කිරීම යි. එය උසස් ම ක්‍රමවේදය ලෙස සැලකිය නො හැකි වුව ද ලෝකයේ ශාස්ත්‍ර යුක්තීන් ආරක්ෂා වන්නේ එබඳු සහේතුක අර්ථ ගැන්වීම් හේතුවෙනි. නිදසුනක් ලෙස සංසාරය පිළිබඳ ව බුදුන් වහන්සේගේ ප්‍රකාශයක් වන්නේ එහි අග මුල දත නො හැකි බව ය. **අනමතග්ගො යං භික්ඛවෙ සංසාරො, පුබ්බාකොටි න පඤ්ඤායති** යන පාඨයෙන් එබැව් කියැවේ. මෙහි අනමගත්ගො යන පදයේ නිෂ්පත්තිය පැහැදිලි කිරීමේ දී ශබ්දකෝෂයන්හි පවා මෙය ව්‍යාකුල පදයක් බව පවසා ඇත. න - මත - අග්ගො යනුවෙන් ඇතැම් විද්වත්හු මෙය විභාග කරති.[38] එහෙත් ස්වරයක් නැති තැන්හි ආදේශ වන්නේ අකාරයක් පමණකි. න සුරො අසුරො,න - බ්‍රාහ්මණො අබ්‍රාහ්මණො යනාදිය නිදසුන් ය. න නිපාතයට අන් ආදේශය වන්නේ පරපදයේ මුල ස්වරයක් ඇත්නම් පමණක් ය[39] යන්න ව්‍යාකරණ රීතියක් මෙන් ම ශබ්ද විද්‍යාත්මක භාවිතයක් ද වේ. (න අච්ඡරියො අනච්ඡරියො, න ඉස්සරො - අනිස්සරො) මේ නිසා න - මත - අග්ගො යන පද විභාගය නිවැරදි නම් එය අනමතග්ගො නො ව අමතග්ගො යනුවෙන් විය යුතු බැවින් ඉහත අදහස පිළිගත නො හැකි ය. එහෙයින් ම තවත් සමහරු **අනවයග්ග,**[40] **අනවදග්ග**[41] යන පදවලින් මෙය පැමිණ ඇති බව කියති. එහෙත් එය ද පිළිගැනීමට හේතු නැත. සංස්කෘත ග්‍රන්ථවල අනමතග්ග යන්න වෙනුවට යොදා ඇත්තේ අනවරාග්‍ර[42] යන්න යි. මුල අග දත නො හැකි යන අදහසින් එය ද යොදා ඇත. අනවරාග්‍ර යන්නෙන් අනමතග්ග යන පද බිඳී ආවක් ද? නැතහොත් අනමතග්ග යන්නෙන් අනවරාග්‍ර යන්න පැමිණියේ ද යන්න බලන්න. මා සිතන පරිදි අනවරාග්‍ර යන්න පැමිණ ඇත්තේ න + අපර + අග්‍ර යන්නෙනි. න + අපර + අග්‍ර > න + අවර + අග්‍ර > අන් + අවර + අග්‍ර > අනවරාග්‍ර යනුවෙනි. එවිට එහි අගක් මුලක්[43] නැති යන අරුත ලැබේ. එහෙත් අනමගත්ත යන්න එලෙස විභාග කළ නො හැකි ය. එහෙයින් ශබ්ද විද්‍යාත්මක ව මෙම පද දෙක අතර සම්බන්ධයක් නැත. එය පාලියට ආවේණික පදයකි. සාම්ප්‍රදායක ව්‍යාකරණ රීති අනුව එය සාදා ගත හැකි ය. (න + අතො + අග්ග (විසන්ධිය) >අන්

+ අතො + අග්ග (ස්වරයක් පරව ඇති විට අන් ආදේශය) > අන් + ම් + අතො + අග්ග (මදාසරෙ - මකාරාගමය) > අනමතග්ග). මෙලෙස සාම්ප්‍රදායික රීති අනුව පද විභාග කිරීමෙන් අරුත් දැනවීමට උත්සාහ ගන්නේ නම් එයින් මෙතැනින් පසු මුලක් අගක් නැති යන අරුත ලැබේ.

තව ද සුත්ත යන්න පාලි සූත්‍රාන්ත දේශනා හැඳින්වීම සඳහා හැඳින්වෙන පොදු නාමයක් බව අපි දනිමු. මෙම සුත්ත යන්නෙන් අදහස් වන්නේ කුමක් ද යන්න විග්‍රහ කිරීමට බුද්ධඝෝෂ හිමියන් දැරූ උත්සාහය අතිශය ව්‍යර්ථ වූ අයුරු සුමංගලවිලාසිනියෙන් පැහැදිලි වේ. උගතුන් පෙන්වා දෙන පරිදි සුත්ත යන පදය පැමිණ ඇත්තේ සංස්කෘත සූත්‍ර යන්නෙනි. එහෙත් එය වෛදික සංස්කෘතයෙහි හමුවන සූක්ත යන්නෙන් ප්‍රභවය වී ඇතැයි කේ. ආර් නෝමන් මහතා පෙන්වා දෙයි.[44] සූ - උක්ත (යහපත් කියමන්) වශයෙන් විභාග වන එයින් වේද සූක්තවල දක්නා ලැබෙන ආකාරයේ බුදුන් වහන්සේගේ කෙටි හරවත් ප්‍රකාශන අදහස් වේ. සූත්‍රවල දක්නට ලැබෙන බුද්ධවචනයේ විවිධ ශෛලීන් නවයක් ගැන ප්‍රකාශ වන නවාංගසත්ථුසාසනයේ සුත්ත යන්නෙන් අදහස් වන්නේ එබඳු කෙටි ප්‍රකාශන වේ. ත්‍රිපිටකයේ එබඳු ඉතා සංක්ෂිප්ත දේශනා රාශියක් වේ. නිදසුනක් ලෙස අත්තට්ඨපඤ්ඤා මනුජා අසූචි (ආත්මාර්ථකාමී මනසක් සහිත මිනිසුන් අශුචි මිනිස්සුය)[45] යන්න කෙටි මෙන් ම වැදගත් දේශනාවකි. සංයුත්තනිකායේ සගාථක වර්ගය පිරික්සීමෙන් මෙය වඩාත් පැහැදිලි කරගත හැකි ය. එහි දක්නට ලැබෙන බොහොමයක් සූත්‍ර ඉතා කෙටි ඒවා බව පැහැදිලි කරුණකි. අනෙක බුදුන් වහන්සේ අතින් ඉතා කෙටි වැකියකින් අතිශය හරවත් දේ ගැන ප්‍රකාශ කළ අවස්ථා බොහෝ ය. ධම්මො හවෙ රක්ඛති ධම්මචාරී[46], පඤ්ඤා නරානං රතනං[47], අසජ්ඣාය මලා මන්තා, චිත්තෙන නීයතී ලොකො, අප්පමත්තා න මීයන්ති - යෙ පමත්තා යථා මතා වැනි අසංඛ්‍ය ප්‍රමාණ කෙටි යහපත් ප්‍රකාශන (සු - උක්ත) බුද්ධවචනයෙහි දිස්වේ. බුදුගොස් හිමියන් විසින් සමස්ත **විශුද්ධිමාර්ගයෙහි** විස්තර කෙරෙනුයේ සීලෙ පතිට්ඨාය යනාදි වශයෙන් එක් ගාථාවකින් දේශිත කරුණක් වීම මෙයට මනා නිදසුනකි. එබැවින් සුත්ත යන්නෙන් අදහස් වන්නේ බුදුන් වහන්සේගේ එබඳු කෙටි දේශනා ලෙස හඳුනා ගැනීමේ යුකියක් පවතී. මෙකල මහත් සම්භාවනාවට ලක්වෙන පඬිවදන්, රුවන් වැකි, ප්‍රස්තාව පිරුළු යනාදිය මෙනි.

නෙක්ඛම්ම යන පාලි වචනය ද එබඳු තවත් සංකීර්ණ පදයකි. එය ඇතැම් තැනක නෙක්ඛම්ම යනුවෙන් ද තවත් තැනක නික්ඛම්ම යනුවෙන් ද යෙදී ඇත. **නෙක්ඛම්මං ඛො පනස්ස මනසිකරොතො නෙක්ඛම්මෙ චිත්තං පක්ඛන්දති** - සංගීතිසුත්තං, මෙම දෙපදයට ම සියලු තැන්හි අරුත් දක්වා ඇත්තේ නික්මීම යනුවෙනි. (දිවා විහාරා නික්ඛම්ම සංස්කෘත නෛෂ්ක්‍රම්‍ය යන පදය පාලියට නෙක්ඛම්ම යනුවෙන් පැමිණෙන බව බොහෝ තැන්හි අරුත් දක්වා ඇත. පුරාණ

ඉන්දු ආර්ය ශබ්ද ධ්වනි මධ්‍යතන යුගයට අවතීර්ණ වීමේ භාෂා ලක්ෂණ විමසන විට පාලියේ **ක්ඛ** සහ **ක්ක** යන දෙවිධියෙන් ම පෙනී සිටිය හැකි ය. මෙය **නිෂ්කාම** (කාමය නැති) යන්නෙන් පැමිණි පදයක් බව ද ඇතැම්හු කියති.

ඇතැම්හු ත්‍රිපිටක සූත්‍රාන්තවල හමුවන පද සංස්කෘතයෙන් පැමිණි ඒවා ලෙස හුවා දැක්වීමට වෑයම් කරති. මෙය වැරදි සහිත උත්සාහයකි. සිංහල භාෂාවෙහි **අටපිරිකර, දැළිපිහිය, වඩිනවා** යනාදි පදවලට ඉංග්‍රීසි භාෂාවෙහි ගැළපෙන වචනයක් නැත්තා සේ පෙළෙහි ද ඇතැම් භාවිත සඳහා වෙනත් භාෂාවල පද නැත. නිදසුනක් ලෙස **පධාන** යන පදය ගත හැකි ය. පෙළෙහි මෙය යෙදෙනුයේ **සම්මා වායාම** හෝ **වීර්යය** නැතහොත් භාවනාව යන අරුතිනි. පෙළෙහි භාවිත ප්‍රමුඛ පදයක් වන මෙයින් **වීර්යය වැඩීම** (විරියං හි පදහන්ති තෙනාති පධානන්ති වුච්චති, පටි.ස. අටුවාව) (පධානන්ති භාවනානුයුඤ්ජනං, - ම.නි. ටීකා) මෙයින් සිදු කෙරෙන කාර්යය දෙකක් වේ. 1. අවබෝධ කළ යුත්ත අවබෝධ කිරීම යි. 2. ප්‍රහාණය කළ යුත්ත ප්‍රහාණය කිරීම යි. මේ නිසා ප්‍රහාණය යනු පධාන (වැඩීම හෝ භාවනාව) යන්නෙන් සිදු වන එක් කාර්යයක් පමණකි. එහෙත් ඇතැම් බටහිර උගත්තු මෙම පදය සංස්කෘත ප්‍රධාන යන පදයෙන් භින්න වූවක් ලෙස පෙන්වා දීමට උත්සාහ කරති. සංස්කෘතයේ ප්‍රධාන යන වචනය භාවනාව, වීර්යය හෝ වැඩීම හෝ යනාදි අරුතක කිසිදු තැනක යෙදී නැත. මේ නිසා සම්මප්පධානං (පදහනට්ඨෙන සම්මප්පධානං සමොධානෙති - පටිසම්භිදාමග්ග) යන්න සම්‍යක් ප්‍රධානං යන සංස්කෘත යෙදුමෙන් ගැනීම හෝ සංස්කෘතයට නැගීම වරදකි. එබැවින් සම්‍යක් ප්‍රහාණාය යන සංස්කෘත ප්‍රයෝගයෙන් සම්මප්පහාණාය යන්න පාලියට පැමිණෙතැයි කියන්නෝ ද වෙති. එහෙත් එය ද ශුද්ධ පාලි යෙදුමකි. සම්මා පහාණාය යන පදද්වය සම්මප්පහාණාය යනුවෙන් සෑදී ඇති අතර එය සම්‍යක් ප්‍රහාණාය යනුවෙන් සංස්කෘතයට නැගීමෙහි වරදක් නැත. මෙහි වරද වන්නේ සියල්ල සංස්කෘතය මූලික කොට සිතීමේ දෝෂය යි.

බුද්ධවචනය හැදෑරීම සඳහා ත්‍රිපිටකයේ පැරණි ම ස්වරූපය සුපරික්ෂාකාරී ව අධ්‍යයනය කිරීම අතිශයින් ප්‍රයෝජනවත් වේ. දැනට ලෝකයේ විවිධ ත්‍රිපිටක සංස්කරණ පවතී. මේවා විවිධ සම්ප්‍රදායාබද්ධ ව පවතී. එනම් ශ්‍රී ලංකාව, බුරුමය, සියමය, කාම්බෝජය යනාදි සම්ප්‍රදාය ඒ අතර වේ. පාලි භාෂාවේ පැරණි ම සම්ප්‍රදාය බොහෝ දුරට ආරක්ෂා කළ ශ්‍රී ලාංකික සම්ප්‍රදායට තවමත් ලෝකයේ ගෞරවය හිමිවේ. එය තවදුරටත් ආරක්ෂා කර ගැනීම සඳහා පැරණි සිංහල අත්පිටපත් ආශ්‍රිත අධ්‍යයන පුළුල් ලෙස සිදුවිය යුත්තකි.

## අන්ත සටහන්

1. "පටිසම්භිදා කිණීත්වාන - ඤාණෙන එස්සසෙයය යො
 අච්ඡම්භිතො අනුබ්බිග්ගො - අතිරොචති සදෙවකෙ", මිලින්දපඤ්හපාළි, 340 පිට.
2. අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො අනුඤ්ඤාතපටිඤ්ඤාතො සකෙ ආචරියකෙ තෙවිජ්ජකෙ පාවචනෙ, අම්බට්ඨසූත්‍රය, දී.නි. 1 බලන්න, 82 පිට.
3. Preface of the 'Psalms of The Early Buddhists 1', by Rhys Davids, 1951, PTS, London, p.xxviii.
4. නදානිමෙ ඣායන්තීති ඛො වාසෙට්ඨ අජ්ඣායකා අජ්ඣායකා ත්වෙව තතියං අක්ඛරං නිබ්බත්තං, දී.නි. අග්ගඤ්ඤසුත්තං බලන්න.
5. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, (2002), **පාලි සාහිත්‍යය**, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 19 පිට.
6. පියරතන හිමි, වැගම; **පාලි අට්ඨකථාවන්හි පිළිබිඹු වන ව්‍යාකරණ සම්ප්‍රදාය**, 1990, සීමාසහිත සංඛ මුද්‍රණ ශිල්පියෝ, මරදාන, 64 පිට සිට බලන්න.
7. නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කැලණිය මානෙල්වත්ත විහාරය එකී ස්ථාන දෙකයි.
8. ආටානාටියසුත්ත, බු.ජ.ස. 314 පිට.
9. SL1, SL2, SL3.
10. සඞ්ගීතිසුත්ත බු.ජ.ස. 382 පිට.
11. පාසාදිකසුත්ත බු.ජ.ස. 198 පිට.
12. පාසාදිකසුත්ත 198 පිට.
13. පාසිදිකසුත්ත 198 පිට.
14. C1, 10 p.
15. මෙම පදය අත්පිටපත්වල යෙදෙනුයේ උප්පන්නො යනුවෙන් පමණකි. එහෙත් බු.ජ.මු යෙහි දෙවිධියට ම යෙදේ. සමරහවිට මෙය පුස්කොළ පොත්වල අකුරු ලිවීමේ දී සිදු වූ දෝෂයෙකැයි ද සිතිය හැකි ය. බොහෝ අකුරු එහි බැඳී ඇති සෙයක් පෙන්වන හෙයිනි. බුද්ධජයන්ති මුද්‍රණයේ උප්පන්නො යනුවෙන් සංයුක්තාක්ෂරයක් වශයෙන් යෙදෙනුයේ බොහෝ විට සාමාන්‍ය පහළවීමක් ගැන කියැවෙන තැන්වල දී ය. උපපන්නො යනුවෙන් යෙදෙනුයේ බුදු උපතක් වැනි සුවිශේෂ තැනක දී බව පෙනේ.
16. ඡට්ඨසඞ්ගායනා සහ කාම්බෝජ සංස්කරණවල පමණක් මෙය යෙදේ. එහෙත් සියලු රටවල අත්පිටපත් සහ අනෙක් සියලු සංස්කරණවල භාවිත වන්නේ තනි අකුරක් (ප්ප > ප) වශයෙනි - පාතික සූත්‍රය.

17. ලක්ඛණසුත්ත, බු.ජ.ස. 238 පිට.

18. සියලු සිංහල අත්පිටපත්වල යෙදෙනුයේ මෙම පදය යි.

19. A Dictionary of  Tocharian B, (2013), Douglas, Q, Adams, Amstradam, New York.

20. මහාපදානසුත්තවණ්ණනා, සුමඞ්ගලවිලාසිනී, 1918, හේවාවිතාරණ මුද්‍රණය.

21. පාසාදිකසුත්ත, බු.ජ.ස. 198 පිට.

22. දීඝනිකාය 3 භාගය, ආටානාටිය, බු.ජ.ස. 346 පිට.

23. BM1,II & MM.

24. KM, MM, TM, Be, SLe, Ke. Se.

25. SLe, Ke. Se.

26. සිංහල අත්පිටපත්වල යෙදෙන මෙය PTS සංස්කරණය සඳහා ද තෝරාගත් පදය යි.

27. දීඝනිකාය 2 භාගය, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 256 පිට.

28. -එම-

29. SL1, 11, 111.

30. අරහං (C.K.T.M.Ee.Ke)

31. **දීඝනිකාය,** පාසාදිකසුත්ත, බු.ජ.ස. 200 පිට.

32. සබ්බාකාරසම්පන්නං (B.C.K.T.M.Be.Ee.Ke.Se).

33. **දීඝනිකාය**, පාසාදිකසුත්ත, බු.ජ.ස. 210 පිට.

34. අන්තරධානන්ති (C); අන්තධානං හොතීති (B1); අන්තරධානං හොතිති (T); අන්තරධානං හොති (Ke.Se); අන්තරධානං හොතීති (B2.K.M.Be.Ce.Ee) **පාසාදිකසුත්ත. බු.ජ.ස. 202 පිට.**

35. සස්සතො අත්තා ච ලොකො ච (Ce) **පාසාදිකසුත්ත,** බු.ජ.ස. 230 පිට.

36. හොති ඉද්ධඤ්චෙව (B.K.T.M.Be.Ce.Ke.Se); ඉද්ධං චෙව හොති (C); ඉද්ධඤ්චෙව හොති (Ee) **පාසාදිකසුත්ත** බු.ජ.ස. 206 පිට.

37. ලොකෙ චුන්ද (B.L.Be.Ce); චුන්ද ලොකෙ (C); ලොකෙ (K.M.Ee.Ke.Se) **පාසාදිකසුත්ත,** බු.ජ.ස. 224 පිට.

38. See, A Dictioíry of the Pali Language, (1875), Childers, R.C, Trubner & Co.,Ludagate Hill, London.

39. **විස්තර සඳහා විමර්ශනාත්මක පාලි ව්‍යාකරණය - ද්විතීය භාගය,** මකරුප්පේ ධම්මානන්ද හිමි, 164, 65 පිටු බලන්න.

40. කච්චායන ව්‍යාකරණය, සරෙ අන 334 (345) සූත්‍රය බලන්න.

41. see article Contributions to Pali Laxicography, The American Journal of Philology, Vol, 41, No 1, 1920, pp. 69 -75.
42. දෙවන පරිච්ඡේදයේ 151 ශ්ලෝකය බලන්න.
43. දෙවන පරිච්ඡේදයේ 28 ශ්ලෝකය බලන්න.
44. තුන්වන පරිච්ඡේදයේ 19 ශ්ලෝකය බලන්න.
45. Norman, K.R., A Philological Approach to Buddhism, (1997), School of Oriental and African Studiies Uninversity of London, p. 104.
46. **සුත්තනිපාත**, ඛග්ගවිසාණසුත්ත, අවසන් ගාථාව බලන්න.
47. **සංයුත්තනිකාය**, ජරාසුත්ත, බු.ජ.ස., 66 පිට, කොළඹ.